# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1934/16 – 2015 සැප්තැම්බර් 30 වැනි බදාදා – 2015.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2015 අංක 159 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/4/2013/D/421.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: VSW/DS/LB/ACQU/POLICE.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– අත්කර ගැනීමේ නිලධාරි, යාපනය.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/146 පණ්ඩිතිරප්පු ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ya/SND/2014/27 හා 2014.05.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.3163ක් පමණ වන ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මාප්පපුලම් – ප්‍රමාණය: හෙක්. 0.3163ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව); නැගෙනහිරට: නවරත්නම් නඩරාජාගේ බිරිඳ පරමේෂ්වරී හිමිකම් කියන මාප්පපුලම්; දකුණට: නවරත්නම් නඩරාජාගේ බිරිඳ පරමේෂ්වරී හිමිකම් කියන මාප්පපුලම් සහ එඩ්වර්ඩ් නවරත්නම් සහ තවත් අය හිමිකම් කියන මාප්පපුලම්; බටහිරට: එඩ්වර්ඩ් නවරත්නම් සහ තවත් අය හිමිකම් කියන මාප්පපුලම් සහ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය.

10 – 574

1A – G22391 – 62 (2015/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

මගේ අංකය: 13/97/ඊ/639.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: උනු/3/3ඉඅත්/38/97.

2004.09.16 දින අංක 1358/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 3A පිටුවේ සඳහන් නිවැරදි කිරීමේ නිවේදනයේ "138 (අ) වගන්තිය යටතේ ආඥාව" යනුවෙන් පළ වූ උපශීර්ෂය "38 (අ) වගන්තිය යටතේ ආඥාව" යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015 සැප්තැම්බර් මස 25 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 575